(නවවැනි පාර්ලිමේන්තුව - දෙවැනි සභාවාරය)

**අංක 1(11).]**

# පාර්ලිමේන්තුවේ අංක 1 දරන
# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2022 අප්‍රේල් 22 සිකුරාදා**

---

**2022 මැයි 04 බදාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1472/2022

ගරු රෝහණ බංඩාර මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ 2021 වර්ෂයේ යල කන්නයේ වී වගා කරන ලද කුඹුරු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) ඒ අතරින් කාබනික පොහොර භාවිතා කරමින් වී වගා කරන ලද කුඹුරු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) කාබනික පොහොර භාවිතා කරමින් වී වගා කරන ලද ගොවීන්ට දෙනු ලබන සහන කවරේද;

(iv) අනුරාධපුර දිස්ත්‍රික්කයේ කාබනික වී ගොවිතැන ප්‍රචලිත කිරීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2022 මැයි 05 බ්‍රහස්පතින්දා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1731/2022

ගරු කිංස් නෙල්සන් මහතා,— කම්කරු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පෞද්ගලික අංශයේ සේවයේ නියුක්ත සේවකයන්ගේ විශ්‍රාම ගැන්වීමේ වයස අවරුදු 60 දක්වා ඉහළ නැංවීමට තීරණය කිරීම සඳහා හේතු වූ සාධක කවරේද;

(ii) විශ්‍රාම ගැන්වීමේ වයස අවරුදු 60 දක්වා ඉහළ නැංවීම හේතුවෙන් වයස අවුරුදු 55 සම්පූර්ණ වීමේදී, සේවක අර්ථසාධක අරමුදලේ සහ සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදලේ ප්‍රතිලාභ ලබා ගැනීමේ හිමිකම අහිමි වන බව පිළිගන්නේද;

(iii) එසේ නම්, ඒ සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1946/2022

ගරු ලලිත් එල්ලාවල මහතා,— මහජන ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජනතා විමුක්ති පෙරමුණේ හිටපු නායක රෝහණ විජේවීර මහතාව 1989.11.12 වන දින එවකට පැවති රජය විසින් අත්අඩංගුවට ගෙන ඒ බව මාධ්‍ය මඟින් ප්‍රකාශයට පත් කරන ලද බවත්;

(ii) 1989.11.13 වන දින ඔහු මිය ගොස් ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) රෝහණ විජේවීර මහතාගේ මරණය ස්වභාවික මරණයක්ද;

(ii) නොඑසේ නම්, ඝාතනයක්ද;

(iii) එම මරණය ඝාතනයක් නම්, ඒ සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ අධිකරණයක් මඟින් ලබා දෙන ලද නඩු තීන්දුවක් තිබේද;

(iv) මෙම මරණය සම්බන්ධයෙන් ජනතා විමුක්ති පෙරමුණේ සාමාජිකයකු හෝ නායකයකු හෝ විසින් නීති මඟින් කටයුතු කිරීමට පියවර ගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1947/2022

ගරු වසන්ත යාපාබණ්ඩාර මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගල් කැඩීම, මහනුවර දිස්ත්‍රික්කයේ මහා පරිමාණ කර්මාන්තයක් ලෙස සිදු කරනු ලබන බවත්;

(ii) කුණ්ඩසාලය ප්‍රදේශයේ දිගන, හීපිටිය, අහස්පොකුණ, හා මල්පාන යන ප්‍රදේශවලත් යටිනුවර ප්‍රදේශයේ අලගල්ලේ සහ උඩුනුවර ප්‍රදේශයේ එළුගොඩ හා හඳපාන යන ප්‍රදේශවල එම ගල් කැඩීම් හේතුවෙන් සුවිශාල පාරිසරික හානියක් වන බව අදාළ ආයතනවලට පැමිණිලි කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මේ වනවිට මහනුවර දිස්ත්‍රික්කයේ ගල් කැඩීම සඳහා නිකුත් කර ඇති බලපත්‍ර සංඛ්‍යාව කොපමණද;

(ii) ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයිති ඉඩම්වල එම ගල් කැඩීම සිදු කරන්නේද;

(iii) එසේ නම්, එම ඉඩම්වල ගල් කැඩීම සඳහා ලබා දී ඇති බලපත්‍ර සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ගල් කැඩීම හේතුවෙන් සිදු වන දූවිලි විසිරීම, ගල් ඉවතට විසිවීම, මාර්ග විනාශ වීම ආදී මහජන පීඩා සම්බන්ධයෙන් අනුගමනය කරනු ලබන ක්‍රියාමාර්ග;

(ii) ගල් කැඩීම හේතුවෙන් යටිනුවර, නාවලපිටිය, උඩුනුවර, කුණ්ඩසාලය යන ප්‍රදේශවල ජලමූලාශ්‍ර විනාශ වීම සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග;

කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1959/2022

ගරු ගාමිණී වලේබොඩ මහතා,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා වැවිලි කර්මාන්ත විෂයභාර අමාත්‍යවරයා ලෙස කටයුතු කරන ලද එක් එක් අමාත්‍යවරයාගේ නම හා ධුර කාලය වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) ඉහත එක් එක් අමාත්‍යවරයා විසින් සිය ධුර කාලය තුළ පත් කරන ලද උපදේශකවරුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම එක් එක් උපදේශකවරයාගේ නම, වයස, අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් වෙන් වශයෙන් කවරේද;

(iv) එක් එක් උපදේශකවරයා සඳහා ගෙවන ලද මාසික වැටුප, දීමනා සහ ලබා දී තිබූ වෙනත් පහසුකම් කවරේද;

(v) එම එක් එක් උපදේශකවරයා වෙත පවරා දී තිබූ වගකීම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(vi) එම එක් එක් උපදේශකවරයා නිරත වී ඇති විදේශ සංචාර, එම විදේශ සංචාරවල නිරත වීම සඳහා හේතු වූ කරුණු, ඒ සඳහා දරන ලද වියදම් හා එමඟින් අමාත්‍යාංශයට අත් වූ ප්‍රතිලාභ වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1993/2022

ගරු සමන්ප්‍රිය හේරත් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2015 සිට 2018 දක්වා වූ කාලය තුළ ශ්‍රී ලංකාවේ ජාතික පාසල්වල අනධ්‍යයන කාර්ය මණ්ඩල සඳහා සේවකයන් බඳවාගත් බව එතුමා දන්නෙහිද?

(ආ) එක් එක් ජාතික පාසල සඳහා එසේ බඳවාගන්නා ලද සේවකයන් සංඛ්‍යාව එක් එක් තනතුරු නාමය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2002/2022

ගරු ඩබ්ලිව්.එච්.එම්. ධර්මසේන මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ස්වර්ණ භූමි, ජය භූමි, ඉසුරු භූමි හා රන් භූමි ඔප්පු සහිත ඉඩම්වල අයිතිකරු මියගිය පසු ඒවායේ හිමිකාරිත්වය සම්බන්ධයෙන් පවතින නීතිමය තත්ත්වය කවරේද;

(ii) උක්ත ඉඩම්වල පසු අයිතිය පවුලේ වැඩිමහල් දරුවාට පමණක් හිමිවීම හේතුවෙන් ගැටලු රැසක් උද්ගත වී ඇති බව දන්නේද;

(iii) ඔහු විසින් ඉඩමේ අයිතිය සෙසු සහෝදර/සහෝදරියන්ට ලබා දීම ප්‍රතික්ෂේප කළහොත් ඔවුන්ට ලැබෙන නීතිමය රැකවරණය කවරේද;

(iv) ඊට අදාළ නීති සංශෝධනය කිරීමට පියවර ගන්නේද;

(v) එසේ නම්, එහි වර්තමාන ප්‍රගතිය කවරේද;

(vi) උක්ත ඉඩම්වල උරුමය, පවුලේ දරුවන් අතර සමසේ බෙදී යන ආකාරයෙන් අදාළ ඔප්පු සකස් කිරීමට පවතින බාධාව කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) (i) හි සඳහන් ඉඩම්, කොටස් කිරීමේදී පවතින බෙදුම් සීමාවන්, ගොඩ හා මඩ ඉඩම් අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම බෙදුම් සීමාවන් හේතුවෙන් ගැටලු රැසක් උද්ගත වී ඇති බව දන්නේද;

(iii) එසේ නම්, ඊට අදාළ විසඳුම් කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2004/2022

ගරු (මේජර්) ප්‍රදීප් උඳුගොඩ මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසාය ප්‍රාග්ධන සමාගමේ යම් අක්‍රමිකතාවයක්, අයථා පත්වීමක්, දූෂණ ක්‍රියාවක් හෝ නීති විරෝධි ක්‍රියාවක් සිදු වී තිබේද;

(ii) එසේ නම්, ඒවා වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත සඳහන් එක් එක් කරුණ හේතුවෙන් රජයට අහිමි වී ඇති මූල්‍ය, දේපළ හා මානව සම්පත්වල වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) (i) හි සඳහන් ක්‍රියා සඳහා වගකිව යුතු නිලධාරීන් හඳුනාගැනීමට විමර්ශන සිදු කර තිබේද;

(ii) වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන ඇත්නම්, ඔවුන්ට එරෙහිව ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iii) ඔවුන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගෙන නොමැති නම්, ඊට හේතු කවරේද;

(iv) ඉදිරියේදී ඔවුන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගනු ලබන්නේද;

(v) ඉදිරියේදී සිදු විය හැකි මෙවැනි ක්‍රියා වැළැක්වීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2012/2022

ගරු කේ.පී.එස්. කුමාරසිරි මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කය සඳහා අනුමත කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරි සහ ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරි තනතුරු;

(ii) එම එක් එක් තනතුරේ මේ වනවිට සේවය කරනු ලබන නිලධාරීන්;

(iii) එම එක් එක් තනතුරේ මේ වනවිට පවතින පුරප්පාඩු;

සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ ස්ථාපිත කර ඇති ගොවිජන සේවා මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා මඟින් ගොවීන්ට තාක්ෂණික උපදෙස් ලබා දීමට වැඩපිළිවෙළක් සකස් කර තිබේද;

(iii) එම මධ්‍යස්ථාන මඟින් ගොවීන්ට බීජ වර්ග ලබා දීමට වැඩපිළිවෙළක් සකස්කර තිබේද;

(iv) එසේ නම්, ලබා ගත හැකි බීජ වර්ග කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) බීජ ආනයනය කිරීම සඳහා වාර්ෂිකව වැය වන මුදල කොපමණද;

(ii) දේශීය බීජ වැඩිදියුණු කිරීම සහ සංරක්ෂණය කිරීම සඳහා සකස් කර ඇති වැඩපිළිවෙළ කවරේද;

යන්න තවදුරටත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2023/2022

ගරු මධුර විතානගේ මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ යම් අක්‍රමිකතාවයක්, අයථා පත්වීමක්, දූෂණ ක්‍රියාවක් හෝ නීති විරෝධි ක්‍රියාවක් සිදු වී තිබේද;

(ii) එසේ නම්, ඒවා වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත සඳහන් එක් එක් කරුණ හේතුවෙන් රජයට අහිමි වී ඇති මූල්‍ය, දේපළ හා මානව සම්පත්වල වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) (i) හි සඳහන් ක්‍රියා සඳහා වගකිව යුතු නිලධාරීන් හඳුනාගැනීමට විමර්ශන සිදු කර තිබේද;

(ii) වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන ඇත්නම්, ඔවුන්ට එරෙහිව ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iii) ඔවුන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගෙන නොමැති නම්, ඊට හේතු කවරේද;

(iv) ඉදිරියේදී ඔවුන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගනු ලබන්නේද;

(v) ඉදිරියේදී සිදු විය හැකි මෙවැනි ක්‍රියා වැළැක්වීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2040/2022

ගරු මර්ජාන් ෆලීල් මහතා,—ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා ප්‍රවාහන විෂයභාර අමාත්‍යවරයා ලෙස කටයුතු කරන ලද එක් එක් අමාත්‍යවරයාගේ නම හා ධූර කාලය වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) ඉහත එක් එක් අමාත්‍යවරයා විසින් සිය ධූර කාලය තුළ පත් කරන ලද උපදේශකවරුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම එක් එක් උපදේශකවරයාගේ නම, වයස, අධ්‍යාපන සුදුසුකම්, වෘත්තීය සුදුසුකම් වෙන් වශයෙන් කවරේද;

(iv) එම එක් එක් උපදේශකවරයා සඳහා ගෙවන ලද මාසික වැටුප, දීමනා සහ ලබා දී තිබූ වෙනත් පහසුකම් කවරේද;

(v) එම එක් එක් උපදේශකවරයා වෙත පවරා දී තිබූ වගකීම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(vi) එම එක් එක් උපදේශකවරයා නිරත වූ විදේශ සංචාර, එම විදේශ සංචාරවල නිරත වීම සඳහා හේතු වූ කරුණු, එම සංචාර සඳහා දරන ලද වියදම් හා එමඟින් අමාත්‍යාංශයට අත්වූ ප්‍රතිලාභ වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2022 මැයි 06 සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2043/2022

ගරු කුමාරසිරි රත්නායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා කාලය තුළ ඉන්දීය ආධාර වැඩසටහන යටතේ මොණරාගල දිස්ත්‍රික්කයේ ඉදිකරන ලද නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) එම නිවාස ඉදිකරන ලද ප්‍රදේශවල නම් කවරේද;

(iii) එම නිවාසවල පදිංචි වීමට අවශ්‍ය මූලික පහසුකම් තිබේද;

(iv) ජනතා වතු සංවර්ධන මණ්ඩලය යටතේ සේවය කරන සේවකයන්ට පමණක් ඉහත නිවාස ලබා දීමට තීරණය කර තිබුණේද;

(v) එසේ නම්, එම තීරණය ගන්නා ලද පාර්ශ්වය කවුරුන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉන්දීය ආධාර යටතේ හෝ වෙනත් වැඩසටහනක් යටතේ මොණරාගල දිස්ත්‍රික්කයේ වතුවල සහ වතු ආශ්‍රිතව ජීවත්වන ජනතාව සඳහා නිවාස ඉදිකර දීමට වැඩපිළිවෙළක් තිබේද;

(ii) එසේ නම්, එම වැඩපිළිවෙළ යටතේ ඉදිකරනු ලබන නිවාස සංඛ්‍යාව කොපමණද;

(iii) එම නිවාස ඉදිකරනු ලබන දින වකවානු කවරේද;

(iv) එම නිවාස, ප්‍රතිලාභින්හට ලබා දෙනු ලබන පදනම කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2059/2022

ගරු එම්. ඩබ්ලිව්. ඩී. සහන් ප්‍රදීප් විතාන මහතා,—වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා සංවර්ධන උපාය මාර්ග සහ ජාත්‍යන්තර වෙළඳ විෂයභාර අමාත්‍යවරයා ලෙස කටයුතු කරන ලද එක් එක් අමාත්‍යවරයාගේ නම හා ධුර කාලය වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) ඉහත එක් එක් අමාත්‍යවරයා විසින් සිය ධුර කාලය තුළ පත් කරන ලද උපදේශකවරුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම එක් එක් උපදේශකවරයාගේ නම, වයස, අධ්‍යාපන සුදුසුකම්, වෘත්තීය සුදුසුකම් වෙන් වශයෙන් කවරේද;

(iv) එම එක් එක් උපදේශකවරයා සඳහා ගෙවන ලද මාසික වැටුප, දීමනා සහ ලබා දී තිබූ වෙනත් පහසුකම් කවරේද;

(v) එම එක් එක් උපදේශකවරයා වෙත පවරා දී තිබූ වගකීම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(vi) එම එක් එක් උපදේශකවරයා නිරත වූ විදේශ සංචාර, එම විදේශ සංචාරවල නිරත වීම සඳහා හේතු වූ කරුණු, එම සංචාර සඳහා දරන ලද වියදම් හා එමඟින් අමාත්‍යාංශයට අත්වූ ප්‍රතිලාභ වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2071/2022

ගරු ගුණතිලක රාජපක්ෂ මහතා,— ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2015 සිට 2019 දක්වා වූ කාලය තුළ ස්වාධීන රූපවාහිනී සේවයේ සහ ලක්හඬ ගුවන් විදුලියේ නව ලාංඡන ප්‍රවර්ධනය කිරීම වෙනුවෙන් වැය කරන ලද මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා වූ කාලය තුළ ස්වාධීන රූපවාහිනී සේවය සහ ලක්හඬ ගුවන් විදුලිය සඳහා බඳවාගන්නා ලද උපදේශකවරුන් සංඛ්‍යාව;

(ii) එම එක් එක් උපදේශකවරයාගේ නම, අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්, ගෙවන ලද මාසික වැටුප, දීමනා හා ලබා දෙන ලද වෙනත් පහසුකම් සහ එම එක් එක් උපදේශකවරයාට ගෙවන ලද සම්පූර්ණ මුදල;

වෙන් වෙන් වශයෙන් කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) ඉහත උපදේශකවරුන් විසින් ස්වාධීන රූපවාහිනී සේවයට සහ ලක්හඬ ගුවන් විදුලියට ලබා දෙන ලද සේවය කවරේද යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2084/2022

ගරු අමරකීර්ති අතුකෝරළ මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2022 වර්ෂයේ මහ කන්නයේ වී අළෙවි මණ්ඩලය විසින් වී මිලදී ගැනීමට අපේක්ෂා කරනු ලබන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2022 වර්ෂයේ මහ කන්නයේ අපේක්ෂිත වී අස්වැන්න;

(ii) එම අස්වැන්නෙන් වී අළෙවි මණ්ඩලය විසින් මිලදී ගැනීමට අපේක්ෂිත වී ප්‍රමාණය;

(iii) එම වී ප්‍රමාණය එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන්;

(iv) 2022 මහ කන්නයේ වී අළෙවි මණ්ඩලය විසින් මිලදී ගැනීමට අපේක්ෂිත වී ප්‍රමාණය, එම කන්නයේ මුළු වී අස්වැන්නේ ප්‍රතිශතයක් ලෙස;

(v) 2022 වර්ෂයේ මහ කන්නයේ වී මිලදී ගැනීම සඳහා වෙන් කරන ලද මුදල;

කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) වී අළෙවි මණ්ඩලය සතු ගබඩාවල ධාරිතාවය ඒවා පිහිටා ඇති දිස්ත්‍රික්ක අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මණ්ඩලය විසින් පෙර කන්නවලදී මිලදී ගත් වී තොග මේ වනවිට ඉතිරිව තිබේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2094/2022

ගරු අජිත් රාජපක්ෂ මහතා,— රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රංජිත් කීර්ති තෙන්නකෝන් මහතා දකුණු පළාතේ ආණ්ඩුකාරවරයා ලෙස කටයුතු කරන ලද අවධියේදී ඔහුගේ ඡායාරූපය දකුණු පළාත් සභාවේ රාජ්‍ය ආයතන තුළ ප්‍රදර්ශනය කරන ලද බවත්;

(ii) ඒ සඳහා වැය කරන ලද මුදල දකුණු පළාත් සභාව විසින් දරන ලද බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් ඡායාරූප ප්‍රදර්ශනය කිරීම සඳහා වැයබරක් දැරීමට මුදල් රෙගුලාසි හෝ වෙනත් විධිමත් ආයතනික නීතියකට අනුව යම් නෛතික බලයක් ආණ්ඩුකාරවරයාට හෝ රාජ්‍ය නිලධාරියකුට තිබේද;

(ii) එසේ නම්, එම නෛතික බලය ලබා දී ඇති ලිඛිත නීතියේ සහතික කළ පිටපතක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2114/2022

ගරු ඉෂාක් රහුමාන් මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය සතු බස්රථ සංඛ්‍යාව;

(ii) එම මණ්ඩලයේ මේ වනවිට සේවය කරනු ලබන සේවක සංඛ්‍යාව;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය සතු මගී ප්‍රවාහන බස්රථ අතරින් මේ වනවිට අධිවේගී මාර්ගවල ධාවනයට යොදවා ඇති බස් රථ සංඛ්‍යාව;

(ii) අධිවේගී මාර්ගවල ධාවනයේ යොදවා ඇති බස්රථ මඟින් ආරම්භයේ සිට මේ දක්වා ලැබූ ආදායම සහ එම බස්රථ වෙනුවෙන් සිදු කර ඇති වියදම වෙන් වෙන් වශයෙන්;

(iii) වර්ෂ 2015 සිට මේ දක්වා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ආදායම සහ වියදම එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන්;

කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2260/2022

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ස්ථාපිත කර ඇති ජාතික පාසල් සංඛ්‍යාව සහ පළාත් පාසල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ජාතික සහ පළාත් පාසල්වල මේ වනවිට පවතින ගුරු පුරප්පාඩු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම පුරප්පාඩු පිරවීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2456/2022

ගරු ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය කාලයේදී වැඩ වර්ජනවල නිරත වූ දුම්රිය ස්ථානාධිපතිවරුන්ගේ ඉල්ලීම් සම්බන්ධයෙන් මේ වනවිට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(ii) පෙර දැනුම් දීමකින් තොරව සිදු කරනු ලබන එවැනි හදිසි වෘත්තීය ක්‍රියාමාර්ගවලට එරෙහිව පියවර ගැනීමේ හැකියාවක් තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2564/2022

ගරු වඩිවේල් සුරේෂ් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වතු ආශ්‍රිතව ජීවත්වන ප්‍රජාවගේ ආගමික, සංස්කෘතික, සුහසාධන හා වෙනත් කටයුතුවලට භාවිතා කිරීම සඳහා එවකට ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය විසින් බදුල්ල දිස්ත්‍රික්කයේ වතු ආශ්‍රිත ප්‍රදේශ ආවරණය වන පරිදි සංස්කෘතික මධ්‍යස්ථාන 16ක් ඉදිකිරීම සඳහා 2019 වර්ෂයේදී අනුමතිය ලබාදී ඒ සඳහා රුපියල් මිලියන 100ක් වෙන් කරන ලද බවත්;

(ii) ඒ අතරින් සංස්කෘතික මධ්‍යස්ථාන 14ක් ඉදිකිරීම සඳහා ඇස්තමේන්තු සකස් කරන ලද බවත්;

(iii) එහෙත් මේ වනවිට එම සංස්කෘතික මධ්‍යස්ථාන ඉදිකිරීමේ වැඩසටහන නතර වී තිබෙන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) උක්ත සංස්කෘතික මධ්‍යස්ථාන ඉදිකිරීමේ මූලික කටයුතු සඳහා රුපියල් මිලියන 20.5 ක් බදුල්ල දිස්ත්‍රික් ලේකම් වෙත ලබා දී තිබේද;

(ii) එම සංස්කෘතික මධ්‍යස්ථාන 16 ඉදිකිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ලබා දෙන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2568/2022

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට මේ දක්වා පර්යේෂණ කටයුතු කිරීම සඳහා ප්‍රතිපාදන අනුමත කර ඇති විශ්වවිද්‍යාල ආචාර්යවරුන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් අචාර්යවරයාගේ නම හා සේවා ස්ථානය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) වර්ෂ 2015 සිට මේ දක්වා එම ආචාර්යවරුන් සඳහා—

(i) අනුමත කරන ලද ප්‍රතිපාදනය;

(ii) අනුමත කරන ලද ප්‍රතිපාදනයෙන් පර්යේෂණ කටයුතු කිරීම සඳහා මේ දක්වා භාවිතා කරන ලද මුදල;

(iii) අනුමත කරන ලද ප්‍රතිපාදනයෙන් භාවිතා නොකරන ලද ප්‍රතිපාදනය;

එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) පර්යේෂණ කටයුතු කිරීම සඳහා අනුමත කරන ලද මුදල, භාවිතා නොකිරීම සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දවන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?